# අභිකුණ්ඨික සමාජයේ සමාජ සංස්කෘතික වෙනස්වීම් : අවිස්සාවේල්ල, ගිරිඋල්ල සහ තඹුත්තේගම නගර ඇසුරෙනි

කේ. නිලංකා මධුෂාණි ජයකොඩි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
madushanijayakodi@gmail.com

---

ප්‍රාථමික ජන කොටස් අතරින් සංචාරක දිවි පෙවතක් ගත කරමින් ශ්‍රී ලංකාවේ ජීවත් වන අභිකුණ්ඨිකයින් දිගු ඉතිහාසයකට උරුමකම් කියන ජන කොට්ඨාසයකි. මොවුන් ඉන්දියාවේ සිට මෙරටට පැමිණි බවට මූලාශ්‍රගත සාධක පවතියි. නයි පනික්කියන් සහ රිලා පනික්කියන් ලෙස කොටස් දෙකක් වශයෙන් ජීවත් වූ මොවුන් විසිවන සියවස වන විට සම්මිශ්‍රණය වී ඇත. අතීතයේ සිටම අභිකුණ්ඨිකයින්ට තමන්ට ආවේණික සංස්කෘතියක් තිබුණු අතර වර්තමානය වන විට එම සංස්කෘතිය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වෙමින්, සම්පූර්ණයෙන් ම නවීකරණය වී තිබේ.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අවිස්සාවේල්ල නගරයේ සහ ගිරිඋල්ල නගරයේ තාවකාලිකව ජීවත් වන අභිකුණ්ඨික ජන කණ්ඩායම් සහ තඹුත්තේගම නගරයේ ස්ථාවරව ජීවත් වන අභිකුණ්ඨික ජන කණ්ඩායම් මුල් කරගෙන සිදු කළ අධ්‍යයනයන්ගෙන් ඔවුන්ගේ සමාජ-සංස්කෘතික වටපිටාව කොතරම් දුරට වෙනස් වී ඇත් ද යන්න හඳුනාගැනීමය. ඔවුන්ටම ආවේණික වූ අර්ථ ක්‍රම, ඇදහිලි විශ්වාස, ද්වාරකර්ම චාරිත්‍ර සහ නීතික්‍රම ආදී සමාජ-සංස්කෘතිකාංග වෙනස් වී ඇති බව හඳුනාගත හැකි විය. ස්ථාවර නිවාස තනාගැනීම, ධනය ඉතිරි කිරීම, රාජ්‍ය පරිපාලන රටාවන්ට අනුගත වීම, පාසැල් අධ්‍යාපනයට නැඹුරු වීම මෙම සමාජයෙහි කැපී පෙනෙන වෙනස්වීම් වේ.

අතීතයේ සිටම පැවත ආ ඇදහිලි-විශ්වාසවල බොහෝ වෙනස්වීම් දැකගත හැකි අතර ගුරුකම්, යන්ත්‍ර මන්ත්‍ර කටයුතු පිළිබඳව ඔවුන්ගේ දැනුම අල්ප වේ. වර්තමානය වන විට බෞද්ධ ආගම ඇදහීම මෙම ජන කොට්ඨාස අතර සුලභව ව්‍යාප්ත වී තිබේ. අත්‍යාවශ්‍ය අවස්ථාවලදී පමණක් මොවුන් සිය පැරණි සිරිත්-විරිත් කෙරෙහි අවධානය යොමු කරනු දක්නට ලැබිණි. අභිකුණ්ඨිකයින් අතර පැවති පැරණි නීති ක්‍රම, අධිකරණ විධි ද සම්පූර්ණයෙන්ම වෙනස්වී තිබේ. අභිකුණ්ඨිකයන් හා කරනු ලැබූ මෙම අධ්‍යයනයෙන් විශාල වශයෙන් ඔවුන්ගේ සංස්කෘතියට සිදු වී ඇති හානිය විමසා බැලුණු අතර ඉන් පෙනීයන්නේ අභිකුණ්ඨික සමාජයන් සතුව පැවති අනන්‍ය ලක්ෂණ ඉවත්වෙමින් මොවුන් මහා සමාජයට අනුගත වන බව ය.

ප්‍රමුඛ පද : අභිකුණ්ඨික ජන සමාජය, සංස්කෘතිය, අවිස්සාවේල්ල, ගිරිඋල්ල, තඹුත්තේගම